# 487 කැමති ලෙසින්

කැමති ලෙසින් අඹනු මැනවි මා
දිව්‍ය කලාකරුවාණෙනි
මැටි පිඩක්ය මා ඔබේ අතේ
ඔබ කැමති හැඩක් රුවක් අඹන්න සමිඳේ

මම නොදනිමි ඔබේ සිතේ තිබෙන මගේ හැඩේ
මට නොහැගේ උතුම’හිමත සැලසුම් ඔබගේ
මගේම යයි මෙතෙක් දුටුව මාවත අඳුරේ
මහා කලාකරුවාණෙනි දැන් එය වැටැහේ

මටම දිනෙක සතුටු වන්න පිළිවන් වන්නේ
ඔබේ අතින් මා හැදුනොත් ලද දුක් අතරේ
මිනිස් දුබල කම නිසාම වේදනා දැනේ
නමුත් සමිඳේ අඹන්න මා ඔබ කැමති ලෙසේ